## 1.1 හැඳින්වීම හා ක්‍රමවේදය

මානව වංශ කථාව තුළ සන්නිවේදනයට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. ලෝකය තුල මානවයා ජීව විද්‍යාත්මක ගතිකත්වයන්ට ලක්වෙමින් පරිණාමනය වන්නේ යම්සේද ඊට සමගාමීව සන්නිවේදනයද වර්ධනාත්මක අවධීන් පසු කල බව මානව ඉතිහාසය සාක්ෂි දරනවාක් මෙන්ම එය අනාගත ලෝකය සඳහාද පොදු ධර්මතාවක් වනු ඇත. ප්‍රාථමික යුග වලදී මිනිසා සරල ජීවන රටාව තුළ භාවිතා කරන ලද්දේ සරල සන්නිවේදන ක්‍රමයක් වුවත් මිනිස් ජීවන රටාව ප්‍රබල ලෙස සංකීර්ණත්වය විසින් වෙලා ගනු ලබද්දී තම අදහස් ප්‍රකාශ කිරීමේ ක්‍රම වේදය හෙවත් සන්නිවේදනයට අලුත් මුහුණු වරක් ආගමනය විය. සමස්ත ලෝකයම එකම ගම්මානයක් එකම ගෘහයක් බවට පත්කිරීමේ අරමුණින් සන්නිවේදනයට විශ්වීය ගුණයක් ආරෝපණය වී ඇත්තේ එහි ප්‍රතිඵලයක් වශයෙන් යැයි කීම යුක්ති යුක්තය. මේ ක්‍රමික විකාශනය තුළ ව්‍යාප්ත වූ ජනමාධ්‍ය යන සංකල්පය මේ වනවිට ලොව ඕනෑම සමාජයක තීරක බලවේගය බවට නිළ නොවන මට්ටමින් පත්ව ඇති බව ප්‍රයෝගික සත්‍යයකි.

වත්මන් ගෝලීයකරන ලොව තුළ ජනමාධ්‍යයන් අතර අති විශාල තරඟකාරීත්වක් දක්නට ලැබේ. ඒ අතරින් ශ්‍රව්‍ය මාධ්‍යයට විශේෂ තැනක් හිමිවේ. අද්‍යතන ගුවන් විදුලි මාධ්‍ය ගත්කල එයට සමාජය තුළ වැදගත් ස්ථානයක් නිරායාසයෙන්ම හිමිවේ. ගුවන්විදුලි වැඩසටහනක් යනු ශ්‍රව්‍ය මාධ්‍යයක් බැවින් හඬ ප්‍රබල ලෙස යොදාගෙන ශ්‍රාවක සිත් තුළට ආමන්ත්‍රණය කරනු ලබයි. සැබවින්ම ගුවන් විදුලි මාධ්‍යයේදී පරිකල්පනය ගොඩනංවනු ලබන්නේ හඬමාධ්‍ය පදනම් කොට ගෙනය. ජනමාධ්‍යක් මගින් ශ්‍රාවකයාට අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා විවිධ ක්‍රම භාවිතා කරනු ලබයි. මෙහිදී වැඩසටහන් ඉදිරිපත් කරන සන්නිවේදකයාට සුවිශේෂී කාර්යභාරයක් සහ වගකීම් මාලාවක් තිබේ. ඔහුගේ මාර්ගෝපදේශකත්වය කුමන හෝ ආකෘතිමය වැඩසටහනක සාර්ථක අසාර්ථක භාවය තීරණය කරනු ලබයි. සැබවින්ම අද සන්නිවේදකයා පිළිබඳව හඳුනාගන්නට ප්‍රථම සන්නිවේදනය යනු කුමක්දැයි හදුනා ගැනීම අපගේ ඉදිරි අධ්‍යයනයට පිටිවහලක් වනු නියතය.

ජනමාධ්‍ය තුළින් සන්නිවේදනය කරනු ලබන සෑම වචනයකම ජනතාවට යම් ප්‍රයෝජනවත් යම් වටිනාකමක් සැලසෙන දෙයක්ම ග්‍රහකයාට ලබාදීම මාධ්‍යවේදියාගේ භූමිකාව වෙයි. මාගේ පර්යේෂණ මාතෘකාව වන "ගුවන් විදුලි සන්නිවේදකයාගේ භාෂා භාවිතය" පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ශ්‍රාවක ආකර්ශනය තීව්‍ර කිරීමට එය කෙතරම් දුරට බලපෑමක් එල්ල කරනු ලබත්ද? යන්න විමසුමට ලක්කරනු ලබයි. යහපත් ජනමාධ්‍ය භාවිතයක් තුළින් සමාජයත් රටත් රටේ ජනතාවගේ චින්තන ධාරාවත් දියුණු වන්නට හේතු වන අතර මේ තුළින් යහපත් සමාජානුයෝජන ක්‍රියාවලියක්ද නිරන්තරයෙන් ඉටු කිරීමට ජනමාධ්‍යට හැකියාව තිබේ. නමුදු අද්‍යතනය වන විට මෙම කාර්යය කෙතරම් දුරට ජනමාධ්‍ය තුළින් ඉටුවේද? එයිනුදු නූතන ගුවන් විදුලි මාධ්‍ය ශ්‍රී ලංකා ජන සමාජයට

කෙතරම් දුරට සමීප වී තිබේද? මේ වන විට බහුලව කතා බහට ලක්ව ඇති ප්‍රබල කාරණාවක් වන ජනමාධ්‍ය අතරින් විශේෂ වශයෙන් ගුවන් විදුලිය තුළ එහි සිටින සන්නිවේදකයන් එනම් නිවේදකයින් භාෂාවත් සමාජයත් කාබාසිනිය කරන බවට නැගෙන චෝදනාව, ආදී කාරණා විමසුමට ලක් කිරීම මාගේ වෑයමයි. ඇතැම් පිරිසක් වත්මන් නිවේදක නිවේදිකාවන් ප්‍රසිද්ධියේම විවේචනය කරන අතර එෆ් එම් නාලිකාවල සිටින ඇතැම් නිවේදක නිවේදිකාවන්ගේ දක්ෂතාවය නිසාම ශ්‍රාවකයින් තවමත් ගුවන් විදුලිය වටා අතනොහැර සිටින බවක්ද පැහැදිලිවම දක්නට ලැබේ. ඒ අනුව මාගේ වෑයම සන්නිවේදකයින්ගේ එනම් නිවේදකයින්ගේ භාෂා භාවිතය හේතුවෙන් ශ්‍රාවක ආකර්ශනය වැඩිවී තිබේද? අඩුවී තිබේද? යනාදී කාරණා විමසුමට ලක් කිරීමයි.

ගුවන් විදුලිය තුළ "සන්නිවේදක" යන තැනැත්තාට සුවිශාල කාර්යභාරයක් හිමිවෙයි. මෙහිදී මාගේ අධ්‍යයනයේ පහසුව තකා සන්නිවේදකයා ට හිමි කාර්යභාරයන්ගෙන් වැදගත්ම කාර්යයක් වන "නිවේදක" ක්‍රියාවලිය පිළිබඳව පමණක් මාගේ අධ්‍යයනය සීමා කිරීමට සිදුවෙයි.

වර්තමානයේ ඇතැම් විචාරක මතවලට අනුවද "නිවේදක" යන වෘත්තිය යම් මාධ්‍ය ආයතනයක ආයතනික ප්‍රතිප්තති සහ එම ආයතනයේ වාණිජ්‍ය අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා පමණක් වෙහෙසෙන ස්වරූපයක් පිළිඹිබු වෙයි. නිවේදක වෙලාව කීම හෝ එම මාධ්‍ය ආයතනයේ දැන්වීම් ටික ප්‍රචාරය කිරීම පමණක් ඔහුගේ කාර්යභාරය නොවේ. සන්නිවේදකයෙකුගෙන් මීට එහා ගිය මෙහෙයක් ශ්‍රාවකයින් බලාපොරොත්තු වන අතර වේලාව කියමින් ආයතනික ප්‍රතිපත්තීන්ට පමණක් සීමා වෙමින් තටයුතු කරන කල රටත් මහජනතාවත් නිවැරදි දැක්මකට යහපත් මාර්ගෝපදේශකත්වයකට ගෙන ඒමේ ක්‍රියාවලිය ඔහුගෙන් ගිලිහෙනවා නොවේද?

ලොතරැයි විකුණනන්නාද නිවේදකයෙකි. නමුදු ඔහුගෙන් ජනතාව මාර්ගෝපදේශකත්වයක් අපේක්ෂා නොකරයි. ජනතාවගේ වටිනා සම්පතක් වන ගුවන් කාලය වටිනා සම්පතක් බව වටහාගෙන ජනතාවට හරවත් සහ ජනතාවගේ ඉටු නොවුණු අවශ්‍යතාවයන් නොඑසේ නම් එවැනි රික්තකයන් නොපිරිහෙලා ඉටු කරන සන්නිවේදන භූමිකාවක් "නිවේදක" තනතුර තුළින් ජනතාව බලාපෙරොත්තු වන බව මගේ හැඟීමයි. සන්නිවේදකයා යම් සමාජයක වෙසෙන සාමාජිකයන්ට ජනමාධ්‍ය භාවිතයෙන් ආරක්ෂාව සපයන්නෝ තමන්ගේ අභිමත මාධ්‍යට කැපවීමෙන් යුක්තවූ පෞරුෂය හේතු කොට ගෙන සන්නිවේදකයා තමන්ගේ සංස්කෘතියට ප්‍රතිවිරුද්ධව ගමන් කරයිද , එනම් ප්‍රතිවිරුද්ධ චින්තනයකින් මෙහෙය වීම තුළ ඔහුගේ භූමිකාව නිසි පරිදි වටහා නොගත්තෙකු ලෙස අවබෝධ වන අතර ඔහු මානව හිතවාදියෙකු ද නොවන්නේය. ඔහු උදාර අරමුණු වෙනුවට උදර පෝෂණය වෙනුවෙන් වෙහෙසෙන්නෙකු ලෙස අසන්නන්ට අවබෝධ වනු ඇත .

නිවේදක කලාව අද වනවිට බරපතල සංවාදයකට ලක්වී හමාරය. බී බී සී ආයතනයේ පළමු අධ්‍යක්ෂ 'ජෝන් රීත්' මහතා සැමවිටම ප්‍රකාශ කළේ **"ඔබ ගුවන් විදුලි ශිල්පියෙකු , නිවේදකයෙකු නම් ඔබ පළමුවෙන් දැනුවත්ව, දෙවනුව ඔබේ අසන්නාව**